OL/2010/82-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**82 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | |
|---|---|
| ධීවර හා ආහාර තාක්ෂණය I,II | පැය තුනයි |
| கடற்றொழிலும் உணவுத் தொழினுட்பவியலும் I,II | மூன்று மணித்தியாலம் |
| Fisheries and Food Technology I,II | Three hours |

## ධීවර හා ආහාර තාක්ෂණය I

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. රූපයේ පෙන්වා ඇත්තේ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇති ආකාරයයි. මෙහි බෙංගාල බොක්ක වන්නේ




   (1) *A* ය.
   (2) *B* ය.
   (3) *C* ය.
   (4) *D* ය.

2. ශ්‍රී ලංකාව තුළ ප්‍රෝටීනමය ආහාරයක් ලෙස වැඩි වශයෙන් යොදගැනෙන්නේ මත්ස්‍ය නිෂ්පාදනයි. මත්ස්‍ය ආහාර අනුභවයෙන් සාපේක්ෂව වැඩි ප්‍රෝටීන ප්‍රමාණයක් ලබාගත හැක්කේ
   (1) අලුත් මාළුවලිනි. (2) කරවලවලිනි. (3) කුඩා මාළුවලිනි. (4) ටින් මාළුවලිනි.

3. මිරිදිය ජලාශ හා ගංගා නිම්නවල හමුවන විශාලතම දේශීය මත්ස්‍ය විශේෂය වන්නේ
   (1) ලූලා ය. (2) මගුරා ය. (3) වලයා ය. (4) වැලි ගොව්වා ය.

4. පාරම්පරික කළමනාකරණ යාන්ත්‍රණයක් හරහා මේ දක්වා සාර්ථකව සිදුකෙරෙන ධීවර කර්මාන්තයක් වන්නේ
   (1) රිටි පන්නය වේ. (2) අත්යොත් පන්නය වේ.
   (3) ජා කොටු වේ. (4) මා දැල් වේ.

5. රූපයේ දක්වා ඇත්තේ විවිධ ධීවර කර්මාන්ත සඳහා යොදගැනෙන බිලිකටු වර්ගයි. මේවා අතුරෙන් ටූනා මරුවැල් සඳහා යොදගැනෙන බිලිකටු වර්ගය කුමක් ද?




6. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ඇති කාලීන ජලාශවලට හඳුන්වා දිය හැකි මත්ස්‍ය වර්ග වන්නේ
   (1) නියං කාලයේදී මඩ යටට වී දිවි ගෙවිය හැකි වර්ග වේ.
   (2) අධික වැසි කාලයේදී එකතුවන බොර දියට ඔරොත්තු දෙන වර්ග වේ.
   (3) කෙටි කලකින් අස්වනු නෙලාගත හැකි වර්ග වේ.
   (4) අධික ප්‍රජනක සීඝ්‍රතාවක් ඇති වර්ග වේ.

7. මත්ස්‍ය මාංශවලින් සැකසූ, පරිරක්ෂණය කළ විවිධ ආහාර වර්ග වෙළෙඳපොළේ ඇත. මේවායින් වැඩිම කාලයක් තබාගත හැකි වන්නේ
   (1) උම්බලකඩ ය.
   (2) ටින් මාළු ය.
   (3) 0 °C ට අඩු උෂ්ණත්වයක අධිශීතනය කළ මාළු ය.
   (4) රික්තකමය ඇසුරුම්වල බහාලූ ජාඩි ය.

[ දෙවැනි පිටුව බලන්න.

8. "ප්ලවාංග ⟶ සාලයා ⟶ බලයා" යන ආහාර දාමය අධ්‍යයනය කළ ශිෂ්‍යයකු ඉදිරිපත් කළ ප්‍රකාශයක් හා හේතු විග්‍රහය පහත දක්වේ. ඒ පිළිබඳ නිවැරදි නිගමනය කුමක් ද?
ප්‍රකාශය - වැඩි මත්ස්‍ය අස්වැන්නක් ලබාගත හැක්කේ සාලයන් අල්ලා ගැනීමෙනි.
හේතුව - සාලයන්ගේ මත්ස්‍ය ස්කන්ධය *(Biomass)* බලයන්ට වඩා විශාල ලෙස වැඩිය.
(1) ප්‍රකාශය හා හේතුව සත්‍ය වන අතර හේතුව මගින් ප්‍රකාශය මනාව පැහැදිලි කෙරෙයි.
(2) ප්‍රකාශය හා හේතුව සත්‍ය වන නමුත් හේතුව මගින් ප්‍රකාශය පැහැදිලි නොකෙරෙයි.
(3) ප්‍රකාශය හා හේතුව සත්‍ය වන නමුත් හේතුව හා ප්‍රකාශය අතර සම්බන්ධයක් නැත.
(4) ප්‍රකාශය හා හේතුව අසත්‍ය වන නමුත් ප්‍රකාශය හා හේතුව ගැළපේ.

9. ආහාරයට සුදුසු මත්ස්‍ය **නොවන** ජලජ ජීවීන් වන්නේ
(1) කාප්, මිරිගල් හා කැට්ලා ය. (2) මුහුදු අශ්වයා, බිම්තොල්ලා හා ගිනිමහ ය.
(3) මෝරා, මඩුවා හා ආඳ ය. (4) බෙල්ලා, ඉස්සා හා මුහුදු කූඩැල්ලා ය.

10. විසිතුරු මත්ස්‍ය විශේෂයක් ලෙස ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්, එහෙත් මේ වන විට ස්වාභාවික පරිසරයට නිදහස්වීම නිසා තර්ජනයක් වී ඇති මත්ස්‍ය විශේෂය වන්නේ
(1) මන්නාවා ය. (2) ටුවුට් ය. (3) තිලාපියා ය. (4) රටපෙතියා ය.

11. ශ්‍රී ලංකාවේ සමුද්‍ර අභය භූමියක් ලෙස නම්කර ඇති මුහුදු ප්‍රදේශය වන්නේ
(1) බොනවිස්ටා කොරල් පරයයි. (2) හික්කඩුව කොරල් පරයයි.
(3) ආරුගම්බේ මුහුදු තීරයයි. (4) නිලාවැලි මුහුදු තීරයයි.

12. මෙම රූපයේ පෙන්වා ඇති මාලුවා අල්ලා ගැනීමට කරමල් දැල් යොදා ගන්නේ නම්, තෝරාගත යුතු දැලේ ඇස්වල විශාලත්වය කොපමණ ද?
(1) 4 cm
(2) 6 cm
(3) 8 cm
(4) 10 cm




13. මත්ස්‍ය වගාවේදී ටැංකියේ පවත්වා යුතු ප්‍රශස්ත pH පරාසය වන්නේ
(1) 5 - 7 ය. (2) 7 - 8 ය. (3) 8 - 12 ය. (4) 0 -14 ය.

14. ශ්‍රී ලංකාවේ කලපු සහ මෝය පරිසරවල වෙසෙන කිවුල් දිය මත්ස්‍ය විශේෂ වන්නේ
(1) හල්මල් දණ්ඩියා සහ මල් පුලුට්ටා ය. (2) වේක්කයා සහ ගොඩයා ය.
(3) ගුරාමි සහ ට්‍රවුට් ය. (4) තෝරා සහ මෝරා ය.

15. ඉස්සන් වගාව සඳහා පොකුණක් සෑදීමට තෝරාගත යුත්තේ
(1) වැලි අධික පසක් සහිත ස්ථානයකි. (2) මැටි අධික පසක් සහිත ස්ථානයකි.
(3) මැටි ලෝම පසක් සහිත ස්ථානයකි. (4) වැලි ලෝම පසක් සහිත ස්ථානයකි.

16. ශ්‍රී ලංකාවේ ඉස්සන් සඳහා ට්‍රෝලිං පන්න සිදුකළ හැකි ප්‍රධානතම ප්‍රදේශ වන්නේ
(1) දෙවුන්දර සිට කිරින්ද දක්වා ඇති වෙරළාසන්න මුහුදු ප්‍රදේශයයි.
(2) හික්කඩුව හා උණවටුන ආශ්‍රිත නොගැඹුරු මුහුදු ප්‍රදේශයයි.
(3) ආරුගම්බේ සිට නිලාවැලි දක්වා වෙරළාසන්න මුහුදු ප්‍රදේශයයි.
(4) මන්නාරම් බොක්ක හා පෝක් බොක්ක ආශ්‍රිත නොගැඹුරු මුහුදු ප්‍රදේශයයි.

17. ටැංකියක සිටින විසිතුරු මසුන් ඉන් ඉවත් කිරීමට අවශ්‍ය වූ විට ඒ සඳහා යොදගත හැකි නිවැරදි ක්‍රමය වන්නේ
(1) ඉතා පරිස්සමින් අතින් අල්ලා මසුන් ඉවත් කිරීමයි.
(2) ඉතා පරිස්සමින් අතංගුවක් මගින් අල්ලා මසුන් ඉවත් කිරීමයි.
(3) බිලිකටු යොදා මසුන් අල්ලා ප්‍රවේශමෙන් ඉවත් කිරීමයි.
(4) කරමල් දැලක් යොදා මසුන් අල්ලා ප්‍රවේශමෙන් ඉවත් කිරීමයි.

18. මත්ස්‍ය පැටවුන්ට ලබාදිය හැකි ඉතාමත් පෝෂ්‍යදායී ජීව ආහාරයක් ලෙස ආටීමියා *(Artimia)* හෙවත් බ්‍රයින් ෂ්‍රිම්ප් හැඳින්විය හැකිය. ආටීමියා බිත්තර එකතුකර ගැනීමට හැකිවන්නේ
(1) කාලීන ජලාශවලිනි. (2) නොගැඹුරු මුහුදු ප්‍රදේශවලිනි.
(3) ලුණු ලේවාවලිනි. (4) ගැඹුරු කලපුවලිනි.

● පහත සඳහන් ප්‍රකාශය උපයෝගී කරගෙන, අංක **19** හා **20** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
"ඉක්මන් හා වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සමහර ධීවරයින් විනාශකාරී ආම්පන්න භාවිත කළ ද මෙවැනි ආම්පන්න භාවිතය ධීවර සම්පත්වල තිරසාර පැවැත්මට තර්ජනයකි."

19. ඉහත ප්‍රකාශයේ සඳහන් වන විනාශකාරී පන්නයක් ලෙස සැලකිය හැක්කේ
(1) ගැඹුරු දියේ පණ ඇම් යොදා බලයන් ඇල්ලීම ය.
(2) කලපු තුළ ජාකොටු ඉදිකර මසුන් ඇල්ලීම ය.
(3) අභ්‍යන්තර ජලාශවල මාදැල් යොදා මසුන් ඇල්ලීම ය.
(4) පර ආශ්‍රිතව වෙසෙන විශාල ගල්මාළු අත්යොත් යොදා ඇල්ලීම ය.

[ තුන්වැනි පිටුව බලන්න.

agaram.lk

20. ඉහත ප්‍රකාශයේ "තිරසාර" යන්නෙන් අදහස් වන්නේ
   (1) ධීවර සම්පත්වල අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම ය.
   (2) ධීවර සම්පත් සියල්ල නෙලා ගැනීම ය.
   (3) ධීවර සම්පත් සංරක්ෂණය කිරීම ය.
   (4) ධීවර සම්පත් සියල්ල නෙලා ගැනීමට නොහැකි වීම ය.

21. විදුරු වැංකියක වෙසෙන විසිතුරු මසුන්ගේ වරල් කුණුවීම හා පාරදෘශ්‍ය වීම දක්නට ලැබුණි. මෙයට හේතුවිය හැක්කේ
   (1) බැක්ටීරියාවක් මගින් සෑදෙන වරල් හා වලිග කුණුවීමේ රෝගයයි.
   (2) පරපෝෂීන් මගින් සෑදෙන ඇඟ කැසීමේ රෝගයයි.
   (3) පරපෝෂී කුඩැල්ලන් වරල්වල ලේ උරා බීමයි.
   (4) දිලීර මගින් ඇතිවන මුඛ පුලුන් (mouth wool fungus) රෝගයයි.

22. පසේ නයිට්‍රජන් ප්‍රමාණය වැඩිකර ගැනීමට, කුඹුරු මඩ කිරීමට ප්‍රථම ජලය බැඳ ජලජ ශාක වැවීම කළ හැකිය. මේ සඳහා සුදුසු ශාක විශේෂය වන්නේ
   (1) ඇසොල්ලා ය. (2) ජපන් ජබර ය. (3) සැල්විනියා ය. (4) වැලිස්නේරියා ය.

23. මුහුදු පායි ආහාරයට ගැනීමට ශ්‍රී ලාංකිකයන් එතරම් පුරුදුව නොසිටියත් ඔවුහු සීමිත විශේෂ කිහිපයක් ආහාරයට ගනිති. මෙසේ ආහාරයට ගැනෙන මුහුදු පායි විශේෂයක් වන්නේ
   (1) ග්ලැසිලාරියා ය. (2) සාගැසම් ය. (3) පැඩයිනා ය. (4) ජෙලිඩියම් ය.

24. දේහය දිගින් 2 cm වූ මත්ස්‍යයකුට පහසුවෙන් ජීවත්වීමට ලීටර දෙකක ජල ධාරිතාවක් අවශ්‍ය වේ. දිග 60 cm ද පළල 40 cm ද ජලයේ උස 20 cm ද වන වැංකියකට දැමිය හැකි 2 cm දිගින් යුත් මසුන් සංඛ්‍යාව වනුයේ
   (1) 6 කි. (2) 12 කි. (3) 24 කි. (4) 48 කි.

25. උෂ්ණත්වය $-40\ ^\circ C$ ට අධිශීතනය කළ මසුන් නරක්වීමට ප්‍රධාන වශයෙන් බලපාන්නේ
   (1) බැක්ටීරියා බීජාණුවල ක්‍රියාකාරිත්වයයි.
   (2) මේද අම්ලවල ඔක්සිකරණ ක්‍රියාවයි.
   (3) අධික ශීතනයට ඔරොත්තු දෙන බැක්ටීරියා වර්ධනයයි.
   (4) ස්වයං ජීර්ණයයි.

26. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම සඳහා රජය මගින් ජලාශවලට මත්ස්‍ය පැටවුන් මුදාහරිනු ලැබේ. මෙසේ මුදාහැරීමට තෝරාගනු ලබන්නේ කුමන අවස්ථාවේ සිටින මත්ස්‍ය පැටවුන් ද?
   (1) සංසේචිත ඩිම්බ අවස්ථාව (2) කලල අවස්ථාව
   (3) ඇඟිත්තන් අවස්ථාව (4) ඇඟිල්ලන් අවස්ථාව

27. පාවෙන කූඩු තුළ මසුන් වගාකිරීමේදී කූඩුව නියමිත පරිදි ජලාශයේ ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ. පහත දක්වෙන ක්‍රමවලින් වඩා නිවැරදි ස්ථාපිත ක්‍රමය කුමක් ද?




   (1) *A* ය. (2) *B* ය. (3) *C* ය. (4) *D* ය.

● පහත දක්වෙන ඡේදය උපයෝගී කරගෙන, අංක **28** සිට **32** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ත්‍රිකුණාමලයෙන් පිටත් වූ ධීවර යාත්‍රාවක් පළමුවන දින වෙරළේ සිට නාවික සැතපුම් 150 ක් දුරින් විශාල කෙලවල්ලන් සඳහා පන්න කරන ලදී. පසුව තවදුරටත් දියඹ කරා යාත්‍රා කර දෙවෙනි දින වෙරළේ සිට නාවික සැතපුම් 190 සීමාවේ පන්න කරන ලදී. මෝසම් කාලය බැවින් යාත්‍රාව තවදුරටත් දියඹ දෙසට ඇදීගිය අතර තුන්වන දින පන්න කරන ලද්දේ ත්‍රිකුණාමලයට ඉදිරියෙන් වෙරළේ සිට නාවික සැතපුම් 210 ක් දුරිනි."

28. ඉහත සඳහන් ධීවර යාත්‍රාව හැඳින්විය හැක්කේ
   (1) අශ්වබල 15 පිටත සවිකරන ලද එන්ජිමක් සහිත 30′ - 35′ දිග කොල්ලෑ ඔරුවක් ලෙස ය.
   (2) අශ්වබල 25 පිටත සවිකරන ලද එන්ජිමක් සහිත 20′ - 22′ දිග FRP යාත්‍රාවක් ලෙස ය.
   (3) අශ්වබල 32 ඇතුළත සවිකරන ලද එන්ජිමක් සහිත 28′ - 32′ දිග යාත්‍රාවක් ලෙස ය.
   (4) අශ්වබල 54 ඇතුළත සවිකරන ලද එන්ජිමක් සහිත 40′ – 45′ දිග යාත්‍රාවක් ලෙස ය.

29. ඉහත යාත්‍රාව කෙලවල්ලන් ඇල්ලීම සඳහා යොදගන්නා ලද පන්න ක්‍රමය විය හැක්කේ
   (1) ගැඹුරු දිය මරුවැල් ය. (2) මතුපිට පාවෙන මරුවැල් ය.
   (3) පතුලේ එලන මරුවැල් ය. (4) සිරස් මරුවැල් ය.

agaram.lk

30. ඉහත යාත්‍රාව ධීවර කටයුතු කළ ප්‍රදේශ වන්නේ
(1) පළමුවන දින ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ සහ දෙවන දින ජාත්‍යන්තර මුහුදු සීමාවේ ය.
(2) පළමුවන හා දෙවන දින ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ සහ තෙවන දින ජාත්‍යන්තර මුහුදු සීමාවේ ය.
(3) පළමුවන, දෙවන හා තෙවන දින ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ ය.
(4) පළමුවන, දෙවන හා තෙවන දින ජාත්‍යන්තර මුහුදු සීමාවේ ය.

31. ඉහත යාත්‍රාව පන්න කළ ස්ථාන නිවැරදිව හඳුනා ගැනීමට යොදගත් උපකරණය වන්නේ
(1) චන්ද්‍රිකා මානය (GPS) වේ. (2) මාලිමා යන්ත්‍රය වේ.
(3) ධ්වනි මානය (Echo Sounder) වේ. (4) සෝනාර් යන්ත්‍රය (Sonar) වේ.

32. ඉහත යාත්‍රාව ධීවර කර්මාන්තය සිදුකළ කාලය වන්නේ
(1) ජනවාරි - මැයි ය. (2) අප්‍රේල් - ජූලි ය.
(3) ජූනි - ඔක්තෝබර් ය. (4) ඔක්තෝබර් - අප්‍රේල් ය.

33. සාගර පත්ලේ වාසය කරන මත්ස්‍ය කාණ්ඩය පහත දක්වෙන ඒවායින් කුමක් ද?
(1) කෙලවල්ලා, බලයා, අලගොඩුවා (2) සාලයා, හුරුල්ලා, පියාමැස්සා
(3) කොස්සා, මීවැටියා, කලමියා (4) සූඩයා, කාරල්ලා, මොරල්ලා

34. හම්බන්තොටින් පිටත්ව ඊසානදිග ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන යාත්‍රාවක් මසුන් ගොඩබෑම සඳහා පැමිණිය හැකි ආසන්නම ධීවර වරාය වන්නේ
(1) ත්‍රිකුණාමලය වරායයි.(2) දෙවුන්දර වරායයි. (3) කිරින්ද වරායයි. (4) මෝදර වරායයි.

35. අල්ලාගත් මත්ස්‍යයින්ට අයිස් දැමීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
*A* - අල්ලාගත් විගස අයිස් දමූ පසු වැඩි දින ගණනක් තබාගත හැකිය.
*B* - පැය අටකට පසුව අයිස් දමූවිට දින කිහිපයක් තබාගත හැකි නමුත් ගුණාත්මය බාල වේ.
*C* - පැය දෙළහකින් අයිස් දමූ පසු තබාගත හැක්කේ දින එකක් හෝ දෙකක් පමණි.
මෙයින් නිවැරදි ප්‍රකාශ වන්නේ
(1) *A* සහ *B* පමණි. (2) *A* සහ *C* පමණි. (3) *B* සහ *C* පමණි. (4) *A*, *B* සහ *C* යන සියල්ලම ය.

36. විසිතුරු මසුන් ප්‍රවාහනයට සැකසීමේදී
(1) ජලය රත්වීම අවම කිරීම සඳහා ජල බඳුන තුළට අයිස් දැමිය යුතුය.
(2) ප්‍රවාහනය කරනු ලබන දිනට දින දෙකකට පෙර ආහාරදීම නැවැත්විය යුතුය.
(3) ජලය සෙලවීම වැළැක්වීම සඳහා ඉඩ ඉතිරි නොවන ලෙසට බඳුන මුළුමනින්ම ජලයෙන් පිරවිය යුතුය.
(4) ලීයෙන් හෝ රිජිෆෝම්වලින් තනන ලද ඇසුරුම්වල නොව ලෝහවලින් තනන ලද ඇසුරුම්වල මසුන් තැන්පත් කළ යුතුය.

37. විසිතුරු මසුන් ඇතිකරන ටැංකියක ජලය ඉතා ඉක්මනින් කොළ පැහැවීම දක්නට ලැබිණි. මෙය වළකාලීම සඳහා කළ හැක්කේ
(1) වැඩි වාර ගණනක් මසුන්ට ආහාර සැපයීම ය.
(2) ටැංකියට සෘජු සූර්යාලෝකය ලැබීම වැළැක්වීමට ආවරණ දල් යෙදීම ය.
(3) ටැංකියේ ජලය හොඳින් වාතනය කිරීම ය.
(4) ටැංකිය දැඩි සූර්යාලෝකයට නිරාවරණය වන ස්ථානයක තැබීම ය.

38. *A*, *B*, *C* මත්ස්‍ය විශේෂ තුනෙහි ලක්ෂණ පහත දක්වේ.
*A* - අංශ රේඛාවට යටින් උදරීය පෙදෙසේ තද කලු ඉරි දක්නට ඇත.
*B* - කහපාට වරල් පිහිටා ඇත.
*C* - පෘෂ්ඨීය වරල හිසේ සිට වලිගය දක්වා දිවේ.
*A*, *B*, *C* මත්ස්‍යයින් වන්නේ පිළිවෙළින්
(1) බලයා, මෝරා, හුරුල්ලා (2) කෙලවල්ලා, බලයා, තලපතා
(3) අලගොඩුවා, බලයා, ආඳ (4) බලයා, කෙලවල්ලා, සාවාලයා

39. ඉස්සන් වගාව සඳහා පොකුණක් සෑදීමේදී එය,
(1) සෘජුකෝණාස්‍ර විය යුතු අතර, එහි දිග හා පළල පැති අතර අනුපාතය 2:1 විය යුතුය.
(2) සෘජුකෝණාස්‍ර විය යුතු අතර, එහි දිග හා පළල පැති අතර අනුපාතය 3:2 විය යුතුය.
(3) වෘත්තාකාර විය යුතු අතර, එහි විෂ්කම්භය මීටර 4 ට වැඩි විය යුතුය.
(4) ඕවලාකාර විය යුතු අතර එහි ප්‍රමාණය ඉස්සන් සංඛ්‍යාව අනුව වෙනස් විය යුතුය.

40. මුහුදු මට්ටමින් මීටර 1500 ට වඩා ඉහළ ප්‍රදේශවල පිහිටි ජලාශ තුළ වගා කිරීමට වඩාත් සුදුසු මත්ස්‍ය විශේෂය වන්නේ,
(1) තිලාපියා ය. (2) ට්‍රවුට් ය.
(3) ලූලා ය. (4) මිරිගල් ය.

**

[ පස්වැනි පිටුව බලන්න.

agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**82 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

ධීවර හා ආහාර තාක්ෂණය I, II
கடற்றொழிலும் உணவுத் தொழினுட்பவியலும் I, II
**Fisheries and Food Technology I, II**

## ධීවර හා ආහාර තාක්ෂණය II

※ පළමුවන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.

**1.** දිවයින වටා ඇති මුහුදු සීමාවෙන් 517 000 $km^2$ ක අනන්‍ය ආර්ථික කලාපයක සර්ව අයිතිය ශ්‍රී ලංකාව සතුව ඇත. මින් 27 800 $km^2$ ක වපසරියක මහාද්වීප තටකය හෙවත් වෙරළාසන්න මුහුදු තීරය පැතිර ඇත. ඉන් ඔබ්බෙන් ගැඹුරු මුහුද වේ. සමස්ත මුහුදු ප්‍රදේශයෙන් ලැබෙන වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනයෙන් 60% ක් නෙලාගනු ලබන්නේ මුහුදු සීමාවෙන් 11% ක් පමණ වූ මහාද්වීප තටක ප්‍රදේශයෙනි.

(i) 517 000 $km^2$ ක සාගර ප්‍රදේශයක අයිතිය ශ්‍රී ලංකාවට ලැබී ඇත්තේ කුමන සාගරයෙන් ද?
(ii) මෙම සර්ව අයිතිය ශ්‍රී ලංකාවට ලැබුනේ කුමන ජාත්‍යන්තර නීතිය අනුව ද?
(iii) මහාද්වීප තටක ප්‍රදේශයේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි වීමට හේතු **දෙකක්** දක්වන්න.
(iv) මහාද්වීප තටක ප්‍රදේශයෙන් බහුලව අල්ලා ගනු ලබන කුඩා සාමුද්‍රික මත්ස්‍ය විශේෂ **හතරක්** සඳහන් කරන්න.
(v) වෙරළාසන්න මුහුදේ මසුන් ඇල්ලීම සඳහා යොදගැනෙන පාරම්පරික පන්න ක්‍රම **හතරක්** සඳහන් කරන්න.
(vi) ගැඹුරු මුහුදු ප්‍රදේශයෙන් අල්ලා ගනු ලබන ප්‍රධාන මත්ස්‍ය විශේෂ **දෙකක්** නම් කරන්න. එම මසුන් අල්ලාගැනීම සඳහා යොදගැනෙන පන්න ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
(vii) වෙරළාසන්න මුහුදේ භාවිතවන පාරම්පරික ධීවර යාත්‍රා වර්ග **දෙකක්** නම් කරන්න.
(viii) වෙරළාසන්න මුහුදේ භාවිතවන යාත්‍රාවල ඇති වාසි හා අවාසි **දෙකක්** බැගින් දක්වන්න.
(ix) මුහුදු ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායකවන ආකාර **දෙකක්** නම් කරන්න.
(x) භූමිය මෙන් අට ගුණයකින් යුත් සාගර කලාපයක් හිමි වුවත් විවිධ මත්ස්‍ය නිෂ්පාදන තවමත් දිවයිනට ආනයනය කෙරෙයි. ඉදිරියේදී මෙය නවතා ගැනීමට ගතහැකි පියවර **දෙකක්** දක්වන්න.

**2.** වෙනත් මාංශ හා සැසඳූ කල, මාළු ඉතා ඉක්මනින් නරක්වන සුළු ය. පරීක්ෂණ වාර්තා අනුව ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනයෙන් 30% ක ප්‍රමාණයක් ගොඩබාන අවස්ථාවේ දී ගුණාත්මක භාවයෙන් අඩු බව හඳුනාගෙන ඇත.

(i) වෙනත් මාංශවලට වඩා ඉක්මනින් මාළු නරක්වන්නේ මන්දැයි කෙටියෙන් විස්තර කරන්න.
(ii) ගුණාත්මකභාවය ආරක්ෂාවන පරිදි පන්න යොද මසුන් අල්ලා ගැනීමේදී යොදගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) යාත්‍රාව තුළ ගබඩා කිරීමේදී හා ගොඩබෑමේදී මසුන්ගේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට ධීවරයින් දැනුවත් කිරීම සඳහා ක්‍රම හා උපදෙස් අඩංගු කුඩා අත් පත්‍රිකාවක් සකසන්න. අවශ්‍ය නම් රූප සටහන් යොද ගන්න.

**3.** රූප සටහනින් දක්වෙන්නේ මුහුදු මාළු වර්ග දෙකක දේහයේ විවිධ කොටස්වල දර්ශීය සටහන් වේ.




(i) A හා B වර්ගවලට අයත් විය හැකි මසුන් සඳහා උදහරණයක් බැගින් දෙන්න. ඔවුන් ජීවත්වන පරිසරය කුමක්දැයි හඳුනාගන්න. ඒ සඳහා පාදක කරගත් හේතුවක් බැගින් රූපසටහන ඇසුරෙන් සඳහන් කරන්න.
(ii) A හා B මසුන් අතුරෙන් වේගවත්ම පිහිණුම් විලාශයක් පෙන්වන්නේ කුමන මත්ස්‍ය විශේෂය ද? ඔබේ නිගමනයට හේතු **දෙකක්** රූපසටහන ඇසුරෙන් දක්වන්න.
(iii) A හා B වර්ගවලට අයත් මසුන්ගේ ආහාර විලාශ වෙන වෙනම හඳුනාගන්න. ඔබේ නිගමනයට පාදක කර ගත් හේතුවක් බැගින් රූපසටහන ඇසුරෙන් දක්වන්න.

[ හයවැනි පිටුව බලන්න.

4. පහත පෙන්වා ඇත්තේ පාරම්පරික මත්ස්‍ය සැකසුම් ක්‍රියාවලි දෙකකි.

A : මාළු ⟶ ලුණු ⟶ වියළීම

B : මාළු ⟶ ලුණු හා ගොරකා ⟶ පැසවීම

(i) ඉහත සඳහන් ක්‍රියාවලිවලින් ලබාගැනෙන නිම් ඵල නම් කරන්න.
නිෂ්පාදනයේදී වැඩිම කාලයක් ගතවන්නේ කුමන නිෂ්පාදනයට ද? එයට හේතුව කෙටියෙන් විස්තර කරන්න.
ඒවායින් දේශීය ආර්ථිකයට ඇති දායකත්වය කරුණු **දෙකක්** පදනම් කර ගනිමින් විස්තර කරන්න.

(ii) ඉහත එක් නිෂ්පාදන ක්‍රියාවලියක් මගින් මාළුවල ජීව කාලය වැඩිකර ගැනෙන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
එසේ ම නිම් ඵලයේ ජීව කාලය වැඩිකර ගැනීමට දිය හැකි උපදෙස් මොනවා ද?

(iii) ඉහත සඳහන් පාරම්පරික මත්ස්‍ය සැකසුම් ක්‍රම තුළින් වඩා ගුණාත්මක නිෂ්පාදන ලබාගැනීම සඳහා වගබලා ගතයුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.
ඒවායේ නිවැරදි අනුගමනය තුළින් නිම්ඵලයේ ගුණාත්මකභාවය වැඩිවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

5. කොරල්පර, මුහුදේ හමුවන "නිවර්තන වැසි වනාන්තර" ලෙස හඳුන්වනු ලැබේ.

(i) ශ්‍රී ලංකාවේ හමුවන ප්‍රධාන කොරල්පර **දෙකක්** නම් කරන්න.

(ii) කොරල්පර, "නිවර්තන වැසි වනාන්තර" ලෙස හඳුන්වනු ලබන්නේ ඇයිදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ හමුවන වෙනත් පරිසර පද්ධති **දෙකක්** නම් කරන්න. කොරල්පර හා ඔබ සඳහන් කළ පරිසර පද්ධතිවල පැවැත්මට ඇති තර්ජන **දෙකක්** පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

6. ග්‍රාමීය ප්‍රදේශවල තාරාවන්, ගවයන් ආදී සත්ත්ව පාලන ගොවිපොළ ආශ්‍රිතව වැඩි ආර්ථික ප්‍රතිලාභ සඳහා මත්ස්‍ය වගා සිදු කරනු ලැබේ.

(i) ඒකාබද්ධ මත්ස්‍ය වගා මගින් වැඩි ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි ආකාරය කරුණු **දෙකක්** පදනම් කරගනිමින් විස්තර කරන්න. මේ සඳහා යොදගත හැක්කේ කුමන මත්ස්‍ය වර්ග ද?

(ii) මෙවැනි ඒකාබද්ධ වගාවක රූප සටහනක් අඳින්න.

(iii) කුඹුරුවල මසුන් ඇති කිරීම, සත්ත්ව පාලනය ආශ්‍රිත ඒකාබද්ධ මත්ස්‍ය වගාවෙන් වෙනස්වන ආකාරය කරුණු **දෙකක්** පදනම් කරගෙන විස්තර කරන්න.
කුඹුරුවල මසුන් වගාවෙන් ඇති වන වාසි **දෙකක්** සඳහන් කරන්න.

7. රූපයේ පෙන්වා ඇත්තේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින බහුදින යාත්‍රාවකි.



(i) ඉහත යාත්‍රා විශේෂය "බහුදින යාත්‍රා" වශයෙන් හඳුන්වනු ලබන්නේ ඇයි?
මෙම ධීවර යාත්‍රා යොදගනු ලබන්නේ කුමන මුහුදු සීමා තුළ ද?

(ii) "බහුදින යාත්‍රා" වල ඇති පහසුකම්/ලක්ෂණ **පහක්** නම් කර, ඒවායේ ඇති වැදගත්කම විස්තර කරන්න.

(iii) ඉහත රූපයේ පෙනෙන පරිදි බහුදින යාත්‍රාව මසුන් ඇල්ලීම සඳහා යොදගෙන ඇත්තේ කුමන පන්නයදැයි දක්වා, එම පන්නය මගින් ඉලක්ක කරනු ලබන මත්ස්‍ය විශේෂ **දෙකක්** නම් කරන්න.

* * *

agaram.lk